# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2387/44 – 2024 ජුනි මස 07 වැනි සිකුරාදා – 2024.06.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 71 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/2000/FR/58.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ල/ ප්‍රාලේ//3/3/5/2//34.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජුඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.** – ප්‍රාදේශීය ලේකම්, ලග්ගල, පල්ලේගම.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, පිටවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිටවල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මා 1508 හා 2010.02.26 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක.** 01 - **ගෝනමඩවත්ත - ප්‍රමාණය: හෙක්. 11.9690**

උතුරට: පාර සහ ගෝනමඩවත්ත රජයේ කැලය; නැගෙනහිරට: රජයේ කැලය; දකුණට: ගෝනමඩවත්ත පතන සහ ඇළ; බටහිරට: පාර.

EOG 06 - 0050

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 67 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/8/2016/HA/368.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: VADA/N/LA/DS.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 අප්‍රේල් මස 08 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, වඩමාරච්චි උතුර, පේදුරු තුඩුව.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි උතුර (පේදුරු තුඩුව) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/409, පුලෝලි මධ්‍යම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පුලෝලි (වට්ටාරම් අංක 09) පේදුරු තුඩුව නගර සභාව ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු. පි. යා 2926 හා 2020.02.27 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 - කොට්ටවට්ටයි - සැලසුම් අංක 350 සහ 354, පේදුරු තුඩුව මාර්ගය - ප්‍රමාණයඃ හෙක්. 0.3376**

උතුරට: නම නොදන්නා ඉඩම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හිමිකම් කියන, නම නොදන්නා ඉඩම, සන්කරප්පපිල්ලායිගේ බිරිඳ රුක්කුමනී හිමිකම් කියන සහ නම නොදන්නා ඉඩම; නැගෙනහිරට: නම නොදන්නා ඉඩම, සන්කරප්පපිල්ලායිගේ බිරිඳ රුක්කුමනී හිමිකම් කියන නම නොදන්නා ඉඩම, තංගවේලවු නම් අන්පරසන් හිමිකම් කියන සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ නම නොදන්නා ඉඩම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හිමිකම් කියන (මූලික පිඹුර යා 181 හි කැබලි අංක 1); බටහිරට: නම නොදන්නා ඉඩම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හිමිකම් කියන (මූලික පිඹුර යා 181 හි කැබලි අංක 1 සහ 2)

EOG 06- 0051

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.